# පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන ශ්‍රී ලංකාවේ නාවික කටයුතු

ජේ.ජේ. හංසනී

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, jjhansani@gmail.com

ප්‍රමුඛ පද - ශිලාලේඛන, නාවිකයන්, නාවික කටයුතු, වෙළෙඳ සබඳතා

## හැඳින්වීම

මානව පරිණාමය තුළදී පරිණාමීය අවස්ථාවන් පසු කරමින් පැමිණි මානවයා ස්ථිර ජනාවාසකරණයට එළඹෙමින් පියවරෙන් පියවර ශිෂ්ටාචාර ගත වීමේ ප්‍රතිඵලයක් ලෙසින් දියුණු සංවර්ධනීය ශිෂ්ටාචාරයකට අවතීර්ණ විය. පැරණි මානව ශිෂ්ටාචාර කෘෂිකර්මාන්තයට අමතරව ආර්ථික රටාවකට හුරු වූ අතර එම සමාජය විසින් අභ්‍යන්තර වෙළඳාම මෙන් ම බාහිර වෙළඳාම පිළිබඳව ද අවධානය යොමු කිරීමක් දක්නට ලැබේ. බාහිර වෙළඳාම මිනිසා නාවික කටයුතුවලට දියඹ තරණයට යොමු කිරීම මානව ශිෂ්ටාචාරයේ සිදු වූ අද්විතීය ජයග්‍රහණයකි.

මෙහිදී අවධානය යොමු කරන්නේ ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛන උපයෝගී කර ගනිමින් ලංකාවේ නාවුක කටයුතුවල ආරම්භය හා ඒ හා සබැඳි ජාත්‍යන්තර වෙළඳ ආර්ථික කටයුතු පිළිබඳ සොයා බැලීමට ය. බොහෝ විට මුල් බ්‍රාහ්මී ය ශිලා ලිපිවල අන්තර්ගත වී ඇත්තේ සතර දිගින් පැමිණි නොපැමිණි මහා සංඝයා වහන්සේලාට ලෙන් පූජා කිරීම පිළිබඳ තොරතුරුත් ආගමික කටයුතු පිළිබඳ ව වුවත් එ තුළින් ද්විතීක තොරතුරු රාශියක් අනාවරණය වේ. මේ අනුව බ්‍රාහ්මී ශිලාලේඛන පරිශීලනය කරමින් එවක සමාජයේ ජනයා මුහුද සමඟ පැවැත්වූ සබඳතා ,පැරණි නාවුක යාත්‍රා පිළිබඳ ව හා එම ක්ෂේත්‍රයේ විවිධ තනතුරු දැරුවන් පිළිබඳවත් කරුණු අනාවරණය කර ගැනීමට අපේක්ෂිත ය.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනය සිදුකිරීමේ දී ක්ෂේත්‍ර ගවේෂණය මෙන් ම ක්ෂේත්‍ර නොවන ගවේෂණය තුළින් දත්ත එක්රැස් කිරීම සිදු කරන ලද අතර ඒ සඳහා ඇත. මෙම පර්යේෂණයේ සීමාවන් දක්වීමේදී ක්‍රි.පූ. 3 වැනි සියවසේ සිට අනුරාධපුර යුගය දක්වා කාලයට අයත් ශිලාලේඛන උපයෝගී කරගනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡා

ශ්‍රී ලංකාවේ නාවික ගමනාගමන කටයුතු ක්‍රි.පූ. යුගය දක්වා දිවෙයි. ක්‍රි.පූ. යුගයට අයත් බ්‍රාහ්මී ශිලාලේඛනයක් වන ආඬියාගල ලිපියේ නාවිකයෙකු පිළිබඳ දැක් වේ.

> "භොජකටකස නවිකස පද
> ගඩිනි"(Ic.vol.i.No.105)

භොජකට (නම් ස්ථානයට යමින් සිටි) නාවිකයාගේ පියගැටයි. මෙහි සඳහන් වන්නේ නාවිකයෙකු පිළිබඳව යි. ලිපියේ එන පරිදි ඔහු "භොජකට" නැමති ස්ථානයට ගමන් කරමින් සිට ඇත. තත්කාලීන සමාජයේ "පියගැට" එනම් පඩි පෙලක් ඉදිකිරීමට තරම් මූල්‍යමය තත්ත්වයක් එම නැවියා සතුව තිබූ බවට පැහැදිලි වේ. මෙ කල නාවික කටයුතු

සමාජයේ ඉහළ ස්ථානයක තිබුණු බව උපකල්පනය කල හැකි ය.

අනුරාධපුරයේ අභයගිරියේ ආශ්‍රිත ගල් කුලක දක්නට ලැබෙන ලිපියේ ද නැවියෙකු පිළිබඳ සඳහන් වේ.

"--- අශනෙ (උෟ) කබිර ශුඝතහ (එ) නවික කාරවහ අශනෙ"
"ආසනය (උෟ) කුබිර සුජාතාගේ (එ) කාරහ (තා)නැවියාගේ ආසනය" (IC.vol.i.No:270)

මෙහි සඳහන් වන්නේ "කාරහ" නම් නැවියෙකුගේ ආසනයක් පිළිබඳවයි.

පොලොන්නරු දිස්ත්‍රික්කයේ දූවේගල ලිපියකින් ද නාවික කටයුතු පිළිබඳ ව තොරතුරු ලබාගත හැකි ය. මෙම ලිපිය පිළිබඳ පරණවිතාණයන්ගේ අදහස වෙනස් එකකි.

"භරත ශගරකිතශ ලෙණෙ" (Ic.vol.i.No 270)

භරත සංඝරක්ඛිතගේ ලෙණ වශයෙනි. " ශගරකිතශ" යනු"සංඝරක්ඛිත යන්න බවයි. පරණවිතාණයන් ශගරකිතශ යන්න මෙසේ කියවන නමුත් එම ලිපියේ දක්නට ලැබෙන නැවක හා කුඹගසක ආකෘතියක් මෙන් ම ඒ මත යන්ත්‍රයක් ද දක්නට ලැබීමෙන් ශගරකිතශ යන්න සාගර කීර්ති යනුවෙන් අර්ථ දැක්විය හැකි ය. එහි අර්ථය වන්නේ "භර්තෘ සාගර කීර්තිගේ ලෙණ" යන්න යි. එම ලෙණ් පූජාව සිදුකර ඇත්තේ සාගර හෙවත් " සමුදු කීර්ති" නම් අයෙකි. ඔහු නාවික කටයුතුවලින් කීර්තියට පත් ප්‍රධානියෙකු විය හැකි ය. එසේම නැවේ කුඹගසක ආකෘතියක් හා ඒ මත යන්ත්‍රයක් ද දක්නට ලැබීමෙන් ඒ බව සනාථ වේ. එවක සමාජය නැවක ආකෘතිය, එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා අවබෝධයෙන් යුතු බව පසක් වේ. ක්‍රි.පූ. යුගයේ නාවුක කර්මාන්තය පැවති බවට නොමැකෙණ ලකුණකි.

(දූවේගල ශිලාලේඛනය) (Ic.vol.i.No:270)

එසේම අම්පාර දිස්ත්‍රික්කයේ රජගල ශිලාලේඛනයක නාවික කටයුතු හා සම්බන්ධ පුද්ගලයෙකු පිළිබඳ තොරතුරුදැක් වේ.

"ගපති ශගර පුත මඣිමහ"
"ගහපති සාගරගේ පුත්‍ර මජ්ඣිමගේය"

"සාගර පුත්‍ර" ලෙසින් හඳුන්වන ඔහු මහ සමුදුර තරණය කළ දක්ෂයෙකු බවට නොරහසකි. ඔහු සාගරයේ පුත්‍ර ලෙසින් වරම් ලැබීමට අනිවාර්යෙන් මුහුදු කටයුතුවලට අති දක්ෂයෙකු විය යුතු ය.

හඳගල ශිලාලේඛනයක මෙසේ සඳහන් වේ.

"නවිකහ මතය උපසික සමණිය ලෙණෙවතු දිස සඟපතිඨපිතේ" (Ic.vol.i.No.1131)

මෙහි සඳහන්වන්නේ නාවිකයාගේ මව වන උපාසිකා සමණියගේ ලෙණ් පූජාව පිළිබඳ ව යි.ඇය නාවිකයෙකුගේ මවකි. ඔවුන්ගේ, සමාජ තත්ත්වය එවක සමාජයේ නැවියා සමාජයේ ඉහළ ඨකියාවක නියුතු අයෙක් බවට සැලකිය හැකි ය.

"පරුමක බරුකචග - මලහ ලෙණෙ සගහ"(Ic.vol.i.No.1183)

ඉහත දැක්වෙන්නේ හගවා ලෙණේ ලිපියකි. භාරුකච්ච - ගාමී (නැවියෙකු) ප්‍රමුඛ මලගේ ලෙණ සංඝයා වහන්සේලාට යි. භාරුකච්චගාමී යනුවෙන් භාරුකච්ච තොටුපල බලා ඇදෙන නාවිකයෙකු, යාත්‍රිකයෙකු බව අනාවරණය වේ. මෙහි සඳහන්

භාරුකච්ච වරාය අනෙකක් නොව දිවයිනට ආසන්නම රට වූ ඉන්දියාවේ භාරුකච්ච වරාය යැයි උපකල්පනය කළ හැකි ය .

පරමාකන්ද ලිපියකට අනුව

**"පරුමක අභය පුත පරුමකහ තිශහ - දුට කණ - යතහ වොඩි** "(Ic.vol.i.No.1183)

එහි අර්ථය වන්නේ ප්‍රමුඛ අභයගේ පුත ධෘෂ්ය කර්ණ යාත්‍රික ප්‍රමුඛ තිස්සගේ සැළියයි යන්න යි. මෙහි යතහ යනු" **යාත්‍රික**"යන්න යි. ඔහු නාවික කටයුතුවල නියැලුණු යාත්‍රිකයෙක් විය හැකි ය. එසේම පරමාකන්ද ශිලාලේඛනයක තවත් නැවියෙකුගේ තොරතුරු දැක් වේ.

**"පරුමක අ දුත නවිකහ බය පුත පරුමක තිශ ලෙණෙශගශ"**
( Ic.vol.i.No.1054)
**"ප්‍රමුඛ හෙවත් පරුමක අභයගේ පුත්‍ර ප්‍රමුඛ තිස්ස නම් (දූත) නාවිකයාගේ ලෙණ සංඝයාටයි."**

මෙහි සඳහන් පරුමක අභයගේ පුතා වූ පරුමක තිස්ස නම් නාවිකයා දූතයෙකු වශයෙන් ක්‍රියාකර ඇත. මෙසේ පැරණි ලංකාවේ නාවුක කටයුතුවල යෙදුනු නැවියන් දූතයන් පිළිබඳ සාධක වේ.

ක්‍රි.පූ. 3 වැනි සියවස තෙක් දිවෙන මෙම ශිලාලේඛන සාක්ෂිවලට අමතරව පුරාවිද්‍යාත්මකව ද නාවික කටයුතු පිළිබඳ සාධක හමුවේ. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් ඓතිහාසික යුගය දක්වා අනුරාධපුර ඇතුලුනුවර සිදුකරන ලද පරයේෂණ කැනීම් වලින් හමුවූ මැටි බඳුනක ඇති ජලයාත්‍රා සලකුණ තුළින් හා තිස්සමහාරාම අකුරුගොඩ පුරාවිද්‍යාත්මක කැනීම්වලින් හමුවූ ක්‍රි.ව. 4 වැනි සියවසට අයත් වළං කැබැල්ලක සටහන්ව ඇති ජල යාත්‍රාවක චිත්‍රයක් තුළින් ද පුරාණ ශ්‍රී ලංකාවේ නාවික කටයුතු පැවති බව සනාථ වේ.

බ්‍රාහ්මී ශිලාලේඛන වලින් හෙළිවන නාවික කටයුතු හා නාවිකයන්ගේ තොරතුරුවලින් අන්තර් ජාතික වෙළෙඳ සබඳතා පිළිබඳ තොරතුරු සාකච්ඡා කළ හැකි ය.

පෙරියපුලියන්කුලමෙන් හමුවූ ලිපියක

**"දමෙඩ වණිජ ගපති විශකහ ලෙණෙ"**( Ic.vol.i.No.356)

**"ගෘහපති විශාක නම් දෙමළ වෙළෙන්දාගේ ලෙණයි."**

දමෙඩ වණිජ යන්නෙන් දෙමළ වෙළෙන්දෙකු පිළිබඳව අදහස් කෙරෙයි. ක්‍රි.පූ. යුගයේ මෙරටට ද්‍රවිඩ වෙළෙන්දන් පැමිණි බවට ඉන් අනාවරණය වේ. ක්‍රි.පූ. යුගයේ පටන් මෙරට සමුදුර තරණය කිරීම්, නාවික ගමනාගමන කටයුතු වෙළෙඳ සබඳතා තිබූ බවට පැහැදිලි වේ.

**"දමෙඩ - වණිඣ ගපති - විශකහ සෙණිකම්"** ( Ic.vol.i.No.357)
**"ගෘහපතිවිශාක නම් වෙළෙන්දාගේ පියගැටපෙළයි"**

මොවුන් වෙළදාම පිණිස දකුණු ඉන්දියාවෙන් පැමිණි කණ්ඩායමක් විය හැකි ය. දිවයිනට එ කල ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ජාත්‍යන්තර වෙළඳ සබඳතා පැවැත්වූ බවට මෙය කදිම නිදසුනකි. ලංකාව හා ඉන්දියාව අතර ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා පැවැත්වීමට බලපෑ ප්‍රධාන සාධකය වන්නේ නාවික ගමනාගමනය යි.

බ්‍රාහ්මී ශිලාලේඛනවලට අමතර ව අභයගිරි දාගැබ් මළුවේ ලිපියකින් ද අනුරාධපුර අවධියේ මෙරට නාවුක කටයුතු පිළිබඳ තොරතුරු ලබෙ යි.

**"සමුදුරු වරැ සියනා පතියහන් තැබූ පහණි"**
**"සමුද කටයුතුවල යෙදුනු සේනාපතියෙක්**

**විසින් තැබූ ගලකි. "**

මෙහි සියනා පතියන් ලෙස දක්වා ඇත්තේ සේනාපතියන් යන්න යි. සමුද්‍ර කටයුතු භාරව ක්‍රියා කරන සේනාපතියෙකු වූ ඔහු ස්ථිර වශයෙන් මුහුදු ආරක්ෂක කටයුතුවලට සම්බන්ධ අයෙකු බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ නාවික කටයුතුවල ඉතිහාසය ක්‍රි.පූ. යුගය දක්වා දිවයන බවත් පසු කාලීනව නාවික කටයුතුවල දියුණුව දෙ ගුණ තෙ ගුණ වූ බව මින් පැහැදිලි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Paranavithana, S. (1970) ***Inscription of Ceylon***, ***Vol***. I, Department of Archaeology Ceylon, Government printing Ceylon.